*සැ. යු.* - (i) 2013.10.11 දින පළ වූ අංක 1,832 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,833 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1652 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1653 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1655 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1655 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1659 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

අබලි භාණ්ඩ විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම

මෙම දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කර ඇති පහත සඳහන් අබලි භාණ්ඩ විකිණීම සඳහා 2013.11.13 වැනි දින ප. ව. 2.00 දක්වා මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවනු ලැබේ.

මෙම භාණ්ඩ පහත සඳහන් පරිදි ලොට් 12 කින් යුතුව විකිණීම සඳහා ඉදිරිපත් කරන අතර එක් එක් තොගය (ලොට්) සඳහා වෙන වෙන ම මිළ ගණන් ඉදිරිපත් කළ යුතු ය.

මෙම භාණ්ඩ 2013.10.21 වැනි දින සිට 2013.11.12 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ගෙවීමකින් තොරව දෙපාර්තමේන්තුවේ පහත මාලයේ දී පැමිණ පරීක්ෂා කර බැලිය හැක.

එක් එක් තොගය සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ හැකි අතර, මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී එක් එක් ලොට් සඳහා ලැයිස්තුවේ දක්වා ඇති ආපසු ගෙවන තැන්පත් මුදල් 2013.10.21 සිට 2013.11.12 දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වාත් 2013.11.13 වැනි දින ප. ව. 1.00 දක්වාත් දෙපාර්තමේන්තුවේ 13 වන මහලේ ගිණුම් අංශය වෙත ගෙවා මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර ලබාගත හැකි ය.

මුද්‍රා තබන ලද ඔබගේ මිළ ගණන් 2013.11.13 වැනි දින ප. ව. 2.00 හෝ ඊට ප්‍රථම දෙපාර්තමේන්තුවේ 13 වැනි මහලේ පිහිටි සැපයීම් අංශයේ ඒ වෙනුවෙන් තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකි අතර තැපෑලෙන් එවනු ලබන මිළ ගණන් " ගණකාධිකාරී (සැපයීම්), දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02" යන ලිපිනයට ඉහත දිනට හා වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අබලි භාණ්ඩ සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කර මිළ ගණන් ඉදිරිපත් කරන්න. තැපෑලේ දී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම 2013.11.13 වැනි දින ප. ව. 2.00 ට සිදු කරනු ලබන අතර ඒ සඳහා ඉල්ලුම් කරුවන්ට සහභාගි විය හැකි ය.

වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (සැපයීම්) වෙතින් දුරකථන අංක 01- 2338632 මගින් ලබාගත හැක.

මල්ලිකා සමරසේකර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
2013 සැප්තැම්බර් මස 27 වැනි දින.

**භාණ්ඩ විස්තරය**

| *ලොට් අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* | *ආපසු ගෙවන තැන්පතු මුදල රු.* |
|---|---|---|---|
| ලොට් අංක 01 | විවිධ කාර්යාල උපකරණ, විදුලි කේතල, විදුලි බොයිලේරු, කැල්කියුලේටර්, ඇමුණුම් කටු යන්ත්‍ර, පාදස්ථ හා සිවිලිං විදුලි පංකා හා වෙනත් ද්‍රව්‍ය | 380 | 5,000 0 |
| ලොට් අංක 02 | කල් ඉවත් වූ ඉටි කඩදාසි, ඉටි කඩදාසි මකන දියර, පැන්සල්, මුද්‍රා පෑඩ්, තීන්ත වයිට් බෝඩ් මාකර්, වේලාසටහන් යන්ත්‍ර රෝල්, කාබන් කඩදාසි, රෝනියෝ තීන්ත, ගොඩ්රිජ්/ඔලිම්පියා/එප්සන් රිබන්, ටෝනර් වර්ග, ඔලිම්පියා/කැනන් ටේප්, පරිගණක කාට්‍රිජ් විවිධ වර්ග, එයාර් ප්‍රොස්නර් ආදී | 1,598 | 5,000 0 |
| ලොට් අංක 03 | යතුරු ලියන - සිංහල/ඉංග්‍රීසි/දෙමළ | 06 | 5,000 0 |
| ලොට් අංක 04 | ලාච්චු 04 වානේ කැබිනට් | 04 | 5,000 0 |
| ලොට් අංක 05 | පරිගණක අමතර කොටස්, වෛරස් ගාඩ්, මොනිටර්, යූ. පී. එස්, ටර්මිනල්, මයික්, ප්‍රින්ටර් | 190 | 5,000 0 |
| ලොට් අංක 06 | ෆොටෝ කොපි මැෂින්, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් මැෂින්, ඩිජිටල් ඩුප්ලිකේටර් මැෂින්, චෙක් රයිටර් යන්ත්‍ර | 30 | 5,000 0 |

| ලොට් අංකය | විස්තරය | ප්‍රමාණය | ආපසු ගෙවන තැන්පතු මුදල රු. |
|---|---|---|---|
| ලොට් අංක 07 | ලී පුටු, ලී මේස, ඇලුමිනියම් කුෂන් පුටු, ඇලුමිනියම් මේස හා වෙනත් ද්‍රව්‍ය | 73 | 5,000 0 |
| ලොට් අංක 08 | ජංගම දුරකථන, බ්‍රීෆ් කේස්, කාන්තා රාජකාරි බෑග් | 21 | 1,000 0 |
| ලොට් අංක 09 | Cladding Boards (31/2', 4 ½', 5', 6', 91/2', 13') Cladding Frames | 62 | 5,000 0 |
| ලොට් අංක 10 | ඉවත් කරන ලද ටයර් 175/14, 165/13 ආදී | 112 | 5,000 0 |
| ලොට් අංක 11 | ඉවත් කරන ලද වාහන අමතර කොටස්, ඔටෝ ගියර් බොක්ස් 02 ක් හා රිම් හා එන්ජින් කොටස් | තොගයක් | 5,000 0 |
| ලොට් අංක 12 | ඉවත් කරන ලද මෘදු දැව පෙට්ටි විවිධ ප්‍රමාණ | 32 | 500 0 |

** ඉහත තොග වලට අදාළ විස්තරාත්මක භාණ්ඩ ලැයිස්තුව කාර්යාලයට පැමිණ ලබාගත හැකි ය.

10-405

# බඩු බාහිරාදිය විකිණීම්

## මහාධිකරණය - කොළඹ

කොළඹ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ මහාධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ග 2013.11.02 වැනි දින පැය 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට නියමිත වේලාවට පැය භාගයකට කලින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන පරීක්ෂා කළ හැකි ය.

03. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් එදින පැය 9.45 ට පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

04. වෙන්දේසියේ මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසු නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතූන් මත එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ බලය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කල යුතු අතර මිල දී ගන්නා භාණ්ඩ එදින පැය 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

කේ. කුමුදුනී වික්‍රමසිංහ,
මහාධිකරණ විනිසුරු,
කොළඹ.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ මහාධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | එච්. සී. 4757/09 | JQ – 9151 දරන යමහා වර්ගයේ යතුරු පැදිය | 1 |
| 2. | එච්. සී. 753/02 | 1. 146 - 9062 QINGQ1 වර්ගයේ යතුරු පැදිය | 1 |
| | | (අබලන් යතුරු පැදිය - නැවත ලියාපදිංචි කළ නොහැකි ලෙසට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සටහන් කර ඇත) | |
| 3. | එච්. සී. 3904/07 | 1. 14 ශ්‍රී 8550 දරන ත්‍රිවිල් රථය (අබලන්) | 1 |
| | | (අබලන් ත්‍රිවිල් රථය - නැවත ලියාපදිංචි කළ නොහැකි ලෙසට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සටහන් කර ඇත) | |
| | | 2. WPGK 2104 දරන ත්‍රිවිල් රථය (අබලන් ත්‍රිවිල් රථය - නැවත ලියාපදිංචි කළ නොහැකි ලෙසට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සටහන් කර ඇත) | |
| 4. | එච්. සී. 5789/11 | 1. WP MK 2375 බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදිය | 1 |
| | | 2. WPTE 0009 දරන පල්සර් වර්ගයේ යතුරු පැදිය | 1 |
| | | 3. සෝනි වර්ගයේ එෆ් එම් රේඩියෝව | 1 |
| | | 4. ක්‍රියා විරහිත වීඩියෝ කැමරා | 1 |
| | | 5. රිමෝට් කොන්ට්‍රෝලර් | 1 |
| | | 6. බැටරි චාජර් | 1 |
| | | 7. ටී. වී. කේබල් | 1 |
| | | 8. බෆල් | 2 |
| | | 9. 1110 වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 10. 1200 වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 11. මෝටරෝලා ජංගම දුරකථන | 1 |
| | | 12. කැෂියෝ කැල්කියුලේටර් | 1 |
| | | 13. ඩබ්. ටී. 2013 රිමෝට් | 1 |
| | | 14. ටෝච් | 1 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | 15. නොකියා 6120 ජංගම දුරකථන | 1 |
| | | 16 නොකියා ජංගම දුරකථන | 1 |
| | | 17. නොකියා ජංගම දුරකථන | 1 |
| | | 18. කැනන් වර්ගයේ වීඩියෝ කැමරා | 1 |
| | | 19. දුරස්ථ පාලක | 1 |
| | | 20. චාජර් 01යි | 1 |
| | | 21. වයර් කෝඩ් | 1 |
| | | 22. සැම්සුන් ජංගම දුරකථන | 1 |
| | | 23. නොකියා ජංගම දුරකථන | 1 |
| | | 24. මල්ටි මීටර් | 1 |
| | | 25. වෝඩාෆෝන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 26. සීකෝ වර්ගයේ අත්ඔරලෝසු | 1 |
| | | 27. ගල් අල්ලා ඇති රන් පැහැති මුදු | 1 |
| | | 28. යතුරු කට්ටල | 1 |
| | | 29. පරිගණක සීපීයු | 1 |
| | | 30. නොකියා 6020 ජංගම දුරකථන | 1 |
| 5. | එච්. සී. 6497/13 | 1. HP වර්ගයේ මිනි ලැප් ටොප් | 1 |
| | | 2. ergo book 0603 වර්ගයේ අයි පෑඩ් | 1 |
| | | 3. සීරියල් අංක DN6GQHQ3DFJ3 අයි පෑඩ් | 1 |
| | | 4. I Phone වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 5. සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 6. නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 7. නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 8. සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 9. එල් ජී වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 10. නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 11. නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| | | 12. සෝනි වර්ගයේ කැමරා | 1 |
| 6. | එච්. සී. 6035/12 | 1. ස්කෑනරය හා ප්‍රින්ටරය | 1 |
| | | 2. ස්පීකර් | 2 |
| | | 3. මවුස් | 1 |
| | | 4. පවර් ඇඩැප්ටරය | 1 |
| | | 5. සී. පී. යූ. යන්ත්‍රය | 1 |
| | | 6. මොනිටරය සහ යතුරු පුවරුව | |
| 7. | එච්. සී. 1043/02 | 1. TENLUX වර්ගයේ ඩයිනමික් මයික්‍රෝෆෝනය | 1 |
| | | 2. DATAMINI වර්ගයේ පරිගණක ස්පීකර් ජෝඩු | 1 |
| | | 3. එලිෆන්ට් බ්‍රෑන්ඩ් ඩයිනමෝ | 1 |
| | | 4. එලිෆන්ට් බ්‍රෑන්ඩ් ඩයිනමෝ ලයිට් | 1 |
| | | 5. FLAMBLY ඩයිලර්න් කෝෆ් | 1 |
| | | 6. සම්බන්ධතා වයර් | 1 |
| | | 7. වයර් කෝඩ් | 1 |
| | | 8. NEC වර්ගයේ පරිගණක ප්‍රින්ටර් | 1 |
| | | 9. DATAMINI ස්පීකර් ජෝඩු | 1 |
| | | 10. DATAMINI වර්ගයේ පරිගණක මවුස | 1 |
| | | 11. LABAX ඇම්පියර් මීටර් | 1 |
| | | 12. ටූල් කිට් | 1 |
| | | 13. HANHART ස්ටෝප් වොච් | 1 |
| 8. | එච්. සී. 3101/06 | 1. සී පී. යූ. යන්ත්‍රය | 1 |
| | | 2. මොනිටර් | 1 |
| | | 3. ප්‍රින්ටර් | 1 |
| | | 4. ස්කෑන් යන්ත්‍රය | 1 |
| | | 5. යතුරු පුවරුව | 1 |
| | | 6. මවුස් | 1 |
| | | 7. ස්පීකර් | 1 |
| | | 8. වයර් කෝඩ් | 1 |
| 9. | එච්. සී. 4550/09, 4551/09, 45552/09, 4553/09 | 1. LG CE ජංගම දුරකථන | 1 |
| | | 2. 1100 නොකියා ජංගම දුරකථන | 2 |
| | | 3. පරිගණක මොනිටරය | 1 |
| | | 4. සීපීයු යන්ත්‍ර | 1 |
| | | 5. යතුරු පුවරු | 1 |
| | | 6. මවුස් | 1 |
| | | 7. ස්පීකර් | 1 |
| | | 8. පරිගණක මදර් බෝඩ් එක සහ මවුස් | 1 |
| | | 9. සබ්කුපර් | 1 |
| | | 10. ජංගම දුරකථන | 1 |
| 10. | එච්. සී. 6401/13 | 1. හිතාචි මොනිටර් | 1 |
| | | 2. යතුරු පුවරුව | 1 |
| | | 3. කැනන් ප්‍රින්ටර් | 1 |

10-611

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ වාණිජ මහාධිකරණයේ හිමිකම් නොපාන ජනෙල් පියන් 44 ක් 2013.10.22 වැනි දින ප. ව. 2.00 ට අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

භාණ්ඩ මිලදී ගැනීමේ දී මුදලින් ගෙවීම් කළ යුතු අතර එදිනම මුදල් තැන්පත් කළ යුතු ය.

භාණ්ඩ මිල දී ගත් පොදු 172 කුවිතාන්සිය ඉදිරිපත් කළ පසුව භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

කාර්යාලයීය වේලාව තුළ අධිකරණ නිලධරයෙකුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වයි. එච්. ජී. එස්. විජේවර්ධන,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය/පිස්කල් සාම විනිසුරු,
වාණිජ මහාධිකරණය.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

10-540

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය සඳහා රා තැබැරුම් රේන්ද විකිණීම

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම් නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක..................... දරන............................ රා තැබැරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි තැබැරුමේ නම සහ අංකය සඳහන් කොට 2013.11.18 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ජා ඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූලව විය යුතු ය.

05. 2013.11.18 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.
(011-2236428)

නිමාලි ද සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
ජා ඇල.

මගේ අංකය : ජා/1/7/02/06.
2012 ඔක්තෝබර් මස 01 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජා ඇල.

### උපලේඛනය

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්)* |
|---|---|---|---|---|
| 01 | ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2013.11.18 පෙ.ව. 10.30 | 1,500.0 |

10-416

# රජයේ නොවන දැන්වීම්

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ කරනු ලබන දැනුම් දීමයි

පහත විස්තර කරනු ලබන ව්‍යාපාර නම සහිත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බවට දැනුම් දෙමි.

01. සමාගමේ නම : විෂන් ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
02. ලියාපදිංචි අංකය : පී වී 94452
03. ලියාපදිංචි ලිපිනය : අංක 140/2, වල්ලහගොඩ, ගම්පොල.

10-410

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

තල්පේ, මිහිරිපැන්නේ, ගාලවත්තේ, අංක 654 හි පදිංචි යෝග් මැතියස් ස්පර්ක් වන මම, ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් සරත් සුනිල් මනම්පේරි මහතා විසින් වර්ෂ 1990.07.10 දින ලියා සහතික කරන ලද අංක 1370 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස තල්පේ, "ශ්‍රියානි" හි පදිංචි, බින්දු වික්‍රමසේකර යන අය පත්කිරීම වර්ෂ 2013 ක් වූ ඔක්තෝබර් මස 08 වැනි දින සිට නීත්‍යානුකූලව අවලංගු කරන බව මෙයින් සියලු දෙනාගේ දැනගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

10-670

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : සිමොනාස් ට්‍රස්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 94416
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගොල්ෆේස් කෝට් 02, කොළඹ 03

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

10-433/1

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : සා මාර (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 94578
ලියාපදිංචි ලිපිනය : අංක 161, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
පී වී 5958

10-433/2

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

පැරණි නම : විෂන් ප්‍රොපර්ටි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65582
ලියාපදිංචි ලිපිනය : අංක 35, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03
අළුත් නම : ඒෂියා ටික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

10-433/3

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

පන්නිපිටිය, කොට්ටාව, සිරිමල් වත්ත, අංක 1566/2ජී දරන ස්ථානයේ පදිංචි අමුවිට ගමගේ දිලිප් ශානක (ජා. හැ. අංක 801770444 වී) වන මම පන්නිපිටිය, කොට්ටාව සිරිමල් වත්ත, අංක 1566/2 ජී දරන ස්ථානයේ පදිංචි කළුබෝවිලගේ සේපාලි ශ්‍රී කාන්ති යන අයට ප්‍රසිද්ධ නොතාරිස් දයන්ත හේවාවිතාරණ ලියා සහතික කළ අංක 1135 සහ වර්ෂ 2011.02.14 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට තිබූ ඇටර්නි බලය 2013.09.16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඇය විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අමුවිට ගමගේ දිලිප් ශානක.

10-431

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

හෝමාගම, පිංකෙත පාර, අංක 651/37 දරන ස්ථානයේ පදිංචි බුලත්සිංහලගේ ප්‍රියන්ති වන මම හෝමාගම, පිංකෙත පාර, අංක 651/37 දරන ස්ථානයේ පදිංචි ඉඹුල්ඉහගමගේ මාධව මධුශංඛ යන අයට ප්‍රසිද්ධ නොතාරිස් අජිත් මාතරආරච්චි ලියා සහතික කළ අංක 3633 සහ වර්ෂ 2011.03.21 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට තිබූ ඇටර්නි බලය 2013.09.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසුව ඇය විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

10-422

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ග්‍රෑන්ඩ් ඒසියා ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 75976
ලියාපදිංචි ලිපිනය : ට්‍රස්ට් සාප්පු සංකීර්ණය, අංක 10 1/3, ජින්තුපිටිය වීදිය, කොළඹ 13
ලියාපදිංචි දිනය : 2010.12.13

ලේකම්/අධ්‍යක්ෂක.

10-486/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : කුමාරසිරි ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 71510
ලියාපදිංචි ලිපිනය : අංක 235, මාගම්මන, රාගම
ලියාපදිංචි දිනය : 2010.03.15

ලේකම්/අධ්‍යක්ෂක.

10-486/2

---

**සමාගමක් සංස්ථාගත කිරීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සිවික්ස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 79064
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 604/3බී, මුත්තෙට්ටුගොඩ පාර, තලංගම උතුර, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2011 මැයි 30 වැනි දින

සමාගමේ නම : ටෙන් ප්ලස් ප්‍රොඩක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 82694
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 63, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය
සංස්ථාගත කළ දිනය : 2011 නොවැම්බර් මස 28 වැනි දින.

උදේනිකා අබේසිරිවර්ධන,
සමාගම් ලේකම්.

10-480

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ 14, ස්ටේස් පාරේ, අංක 129/9 බී දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 652450385 V හිමි රාමසාමි ශාන්ත කුමාර් වන මා විසින් කොළඹ 14, ස්ටේස් පාරේ, අංක 129/9 බී දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 720200902V හිමි රාමසාමි සුරේෂ් කුමාර යන අයට මා සතු සියලුම දේපළ ප්‍රධානය කරන ලද බව වර්ෂ 2004ක් වූ අප්‍රේල් මස 19 වැනි දිනැති අංක 2044 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2013ක් වූ සැප්තැම්බර් මස 16 වන දිනෙන් අවලංගු කර ඇති බව මහජනතාවට හා ශ්‍රී ලංකා රජයට දැනුම් දෙමි. තව ද, මෙම දිනයෙන් පසු මේ සම්බන්ධව යම් ක්‍රියාවක් කර ඇත්නම් ඒ සම්බන්ධව කිසිදු වගකීමක් මා නොදරන බව තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

10-461

---

## දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : ගැනට් ඇඩ්වර්ටයිසිං (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 99/1, සණස ගොඩනැගිලි සංකීර්ණය, වේයන්ගොඩ පාර, මීනුවන්ගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 93851
සංස්ථාගත කළ දිනය : 2013.07.31

ලේකම්.

10-491

---

## දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ටී ජේ ලෙෂර් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 155/1 ඒ, කොළඹ පාර, ජාඇල
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 93852
සංස්ථාගත කළ දිනය : 2013.07.31

ලේකම්.

10-490

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳව නිවේදනය කිරීම.

සමාගමේ නම : 3 සී එස් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 93342
ලියාපදිංචි කාර්යාලය : 46 ඒ. එස්. ද එස් ජයසිංහ මාවත, කොහුවල

3 සී එස් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම,
වෙනුවෙන් සමාගමේ ලේකම්වරුන්.

10-489/1

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳව නිවේදනය කිරීම.

සමාගමේ නම : සිලෝන් සර්ගෝ ෆාමා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 93693
ලියාපදිංචි කාර්යාලය : අංක 57/1, ශ්‍රී සුමංගල පාර, රත්මලාන

සිලෝන් සර්ගෝ ෆාමා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන්,
සමාගම් ලේකම්වරුන්.

10-489/2

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය.

සංස්ථාගත කිරීමේ දිනය : 2013.01.29
නම : මෙතායා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 90724
ලියාපදිංචි කාර්යාලය : දාස්විලා, මූල්ලපිටිය, බේරුවල

කලම්බු කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

10-488

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සංස්ථාගත කිරීමේ දිනය : 2011.12.09
නම : ලංකා මාස් පබ්ලිෂර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 82962
ලියාපදිංචි කාර්යාලය : 156 සී, මාදිවෙල පාර, නුගේගොඩ.

කලම්බු කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

10-487

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ 9 (i) ඡේදය අනුව මෙයින් දන්වා සිටින වගනම් :

වෙළඳ සමාගමේ නම : දමන හයි - ටෙක් ඩේරි ෆාම්ස් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 5137
ලියාපදිංචි කාර්යාලය : 163 ඒ, ගමමැද පාර, තුඩැල්ල, ජාඇල.

අධ්‍යක්ෂවරු.

10-508/1

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය අනුව මෙයින් දන්වා සිටින වගනම්

වෙළෙඳ සමාගමේ නම : ජෙනරල්ස් මැනර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 94716
ලියාපදිංචි කාර්යාලය : අංක 97 ඒ, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂවරු.

10-508/2

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ජී. අයි. ආර්. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93945
සංස්ථාගත කිරීමේ දිනය : 2013 අගෝස්තු 22
ලියාපදිංචි කාර්යාලය : අංක 22/10 සී, ගොවිකම් පෙදෙස, දිවුල්පිටිය, බොරලැස්ගමුව.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

10-510

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ දැනුම් දෙනු ලැබේ :-

සමාගමේ නම : නානායක්කාර කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 94429
ලියාපදිංචි දිනය : 2013 සැප්තැම්බර් මස 06
ලියාපදිංචි ලිපිනය : අංක 279, කුරුකුලාව, රාගම.

අධ්‍යක්ෂ.

10-511

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : හෙමී ලයින් ලන්කන් ෂිපින් සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගම ලියාපදිංචි අංකය : පී වී 73625
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 79/1ඩී, නුවර පාර, කිරිබත්ගොඩ
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.08.06

10-527

---

## සිලෝන් ටී ගාඩින්ස් ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය : PB 1426

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ සමාගමේ සංධිය ඇවරකරුවන් පත්කිරීමේ දැන්වීම

කොළඹ 04, කාසල් පටුමගේ, අංක 02 හි හතරවැනි මහලෙහි පදිංචි පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් යන අප 2013 සැප්තැම්බර් මස 24 වැනි දින කොළඹ 05, නාරාහේන්පිට නාවල පාර, අංක 153, දරන ස්ථානයේ පිහිටි සිලෝන් ටී ගාඩින්ස් ලිමිටඩ් හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ සංධිය ඇවරකරුවන් වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
සංධිය ඇවරකරුවන්,
සිලෝන් ටී ගාඩින්ස් ලිමිටඩ්.

2013 ඔක්තෝබර් මස 02 වැනි දින,
එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
හතරවන මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

10-529/2

---

## සිලෝන් ටී ගාඩින්ස් ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය : PB 1426

සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2013 සැප්තැම්බර් මස 24 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) *(b)* වගන්තිය යටතේ මෙම සමාගම 2013 සැප්තැම්බර් මස 24 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ඩී. ජේ. අම්බානි,
එල්. ජේ. අම්බානි,
අධ්‍යක්ෂකවරුන්.

2013 ඔක්තෝබර් මස 02 වැනි දින.

10-529/1

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 14, ඇවෙකා අ ලා කෝ 75005 පැරිස් හි පදිංචි ටාරික් අබාරි ප්‍රසිද්ධ නොතාරිස් තැන ඉදිරිපිට දී 2011.05.30 වැනි දින ලියා සහතික කළ ඇටෝර්නි බලපත්‍රය මගින් ප්‍රංශයෙහි, ගුසේන්විල්, 95190, රූ රේමන්ඩ් ලප්චින් අංක 59 හි පදිංචි ෂිරෝමි දේවේන්ද්‍රන් සහ දේවංජ නාලක දේවේන්ද්‍රන් යන දෙදෙනා විසින් අංක 72/79, අතුකෝරල පෙදෙස, මිරිහාන, නුගේගොඩ හි පදිංචි සුමිත් නිශාන්ත අතුකෝරල යන අය වෙත පවරා දෙන ලද සියලුම ගනුදෙනු සතුටුදායක ලෙස සම්පූර්ණ කල බැවින් ඇටෝර්නි බලතල මෙයින් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත දන්වා සිටිමු.

ෂිරෝමි දේවේන්ද්‍රන්,
දේවංජ නාලක දේවේන්ද්‍රන්.

10-530

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඩබ්ලිව් එස් ඕ ටු මොබයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කිරීමේ දිනය : 2013 ජුනි 05
සමාගමේ අංකය : පී වී 92830
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 59, මල් පාර, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

10-543

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : නොරොච්චෝලෙයි වින්ඩ් පවර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : PV 68463
ලියාපදිංචි ලිපිනය : අංක 11, කැපුන්ගොඩ, පමුණුගම.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

10-545

## නිවැරදි කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.09.27 දිනැති ගැසට් පත්‍ර අංක 1830 හි රාජ්‍ය නොවන දැන්වීම්වල I කොටස (II ආ) ඡේදයෙහි පළ කරන ලද , 09-1161 දරන නිවේදනයෙහි "පී බී 80935" වශයෙන් සඳහන්ව ඇති සමාගමේ අංකය, "පී වී 80935" ලෙස නිවැරදි විය යුතු ය.

හර්ෂද හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

10-599

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ, උඩහමුල්ල, කනත්ත පාර, අංක 6/5 හි පදිංචි ගල්බොක්කේ හේවාගේ තිලකරත්න ද සිල්වා වන මම, මහජනයාට දන්වා සිටින වගනම්, පොල්ගස්ඕවිට, මත්තේගොඩ, කුඩාමාදුව පාර, දික්හේනවත්ත ලේක් ව්‍යු සර්කල්, අංක 14 හි පදිංචි ජෝසප් බොනීෆස් පෙරේරා යන අයට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ඩී. අම්ලා දිලිනි විසින් ලියාසහතික කරන ලද අංක 117 හා 2010.10.07 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2013ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින සිට අවලංගු සහ බලරහිත වන බවද, ඔහු විසින් ඇතුලත් වනු ලබන කිසිදු ගණුදෙනුවක බලපැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගල්බොක්කේ හේවාගේ තිලකරත්න ද සිල්වා.

10-584

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියලු දෙනාම මෙයින් දැනගත යුතුයි

කොළඹ 03, 5 වැනි පටුමග, අංක 111 හි පදිංචි විදේශ ගමන් බලපත්‍ර අංක එන් 2952671 දරන රොහාන් ලලිත් විජේසුන්දර වන මම ඒ. ඊ. ආර්. සී. මොරායස් ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද වර්ෂ 1989 සැප්තැම්බර් මස 06 වැනි දිනැති අංක 1874 දරන ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 03, 5 වැනි පටුමග, අංක 111 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 335280113 V දරන හෙලේනා අනෝජා දේවී විජේසුන්දර යන අයට ම විසින් ලබාදුන් ඇටර්නි බලය මෙයින් අවලංගු කරනු ලැබේ.

මාගේ ඇටර්නි බලකරු වන ඉහත නම් සඳහන් හෙලේනා අනෝජා දේවී විජේසුන්දර යන අය විසින් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් මින් ඉදිරියට නොදරන බව මෙයින් දන්වා සිටිමි.

10-577

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) ඡේදය

සමාගමේ නම : ට්‍රම්ප්ස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 75215
ලියාපදිංචි කාර්යාලය : අංක 16/31/1, විජිත පාර, නැදිමාල, දෙහිවල.

10-575

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : කේ/5/7672/කේවයි 4/429.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.06.04 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2013.01.15 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.11.20 වැනිදින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

(1) මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කොට්ඨාසයේ උඩුගොඩ උඩසිය පත්තුවේ පල්ලේපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අකුරම්බොඩ පිහිටි ගෙදරවත්ත නමැති ඉඩමට 2003.03.26 වැනි දින බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් මැන සාදන ලද අංක 7389 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 24.02ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඩී 325/291 යටතේ ලියාපදිංචි වී ඇත.

(2) මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කොට්ඨාසයේ උඩුගොඩ උඩසිය පත්තුවේ පල්ලේපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අකුරම්බොඩ පිහිටි ගෙදර වත්ත නමැති ඉඩමට 2003.03.26 වැනි දින බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් මැන සාදන ලද අංක 7389 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 14.9 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඩී 325/292 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනි.*

2013 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-583/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/46519/එෆ්6/446.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.03.26 *ගැසට් පත්‍රයේ* සහ 2010.05.24 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. ද සිල්වා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.11.26 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ හිරණ සහ ගල්තුඩේ පිහිටි රත්නගිරිය වත්ත නමැති ඉඩමට 1993.11.14 සහ 1993.12.19 දින බලයලත් මිනින්දෝරු ජේ. එන්. වික්‍රමරත්න විසින් මැන සකසන ලද අංක 170 දරන පිඹුරේ කැබලි අංක 16 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 14.25 ක් වූ බිම් කොටස.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 273/283 යටතේ ලියාපදිංචි වී ඇත.

තවද, සී. ඩබ්. ඩී. නෙයිස් මානක තැනගේ අංක 448 හා 1961.12.27 වැනි දින දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක ඒ. සී. සහ ඩී. මතින් සහ ඉහත කී අංක 170 පිඹුරේ දැක්වෙන කැබලි අංක 10 යන කැබලි මතින් මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනි.*

2013 ඔක්තෝබර් මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-583/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 01/47943/CD 9/035.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.10.30 *ගැසට් පත්‍රයේ* සහ 2010.04.21 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.12.03 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තුවේ හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුළ දිද්දෙනිය පිහිටි බණ්ඩාර වත්ත නමැති ඉඩමට 1993.06.09 වැනි දින බලයලත් මිනින්දෝරු එන්. ජී. ඇටිවිලිගල විසින් මැන සකසන ලද අංක 276 දරන පිඹුරේ කැබලි අංක 18 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 11.50ක්වූ බිම් කොටස වේ. මෙය

අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 71/224 ලෙස ලියාපදිංචි වී ඇත.

තවද, ඉහත කී අංක 276 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 23 හා 22 (මාර්ග රක්ෂිත) බිම් කැබලි මත වූ මාර්ග අයිතිය ද ඇතුව වේ. (අංක 3341 දරන උකස්කරයේ මෙහි පිඹුරු අංකය 3341 ලෙස සටහන් ව ඇත).

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ඔක්තෝබර් මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-583/3

---

## මහජන බැංකුව - මහනුවර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කුළුගම්මන සියපත්තුවේ පහළ දුල්වල පිහිටි අස්වැද්දූම කුඹුර හෙවත් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. හීන්කෙන්ද මහතා විසින් 2006.01.14 වැනි දින මැන සාදන ලද අංක 2808 ඒ දරන පිඹුරේ කැබලි අංක 01 (එකී මිනින්දෝරු තැනගේ 2003.05.14 දිනැති අංක 2808 දරන පිඹුරේ කැබලි අංක 02 හි උප බෙදුම) වශයෙන් සලකුණු කොට ඇති පර්චස් විස්සයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 20.5) විශාල කටුකන්දෙනිය හා බණගේතැන්නහේන නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේ ද සමග මහජන බැංකුව විසින් අපවෙත පවරන ලද බලය මත අප විසින් 2013 නොවැම්බර් මස 07 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2008.02.22 වැනි දින ද, ඩේලි නිවුස් පුවත්පතේ 2008.02.13 වැනි දින ද, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2009.10.16 වැනි දින ද, පළකර ඇති දේපළ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානයට යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මහනුවර - කොළඹ පාරේ පේරාදෙණිය නගරය පසුකර පොල්ගහමුල හංදිය දක්වා පැමිණි විට එම මාර්ගයේ දකුණට ඇති මුරුතලාව පාරේ මුරුතලාව කඩමණ්ඩිය තෙක් ගිය විට වමට ඇති පිළිමතලාව දෙසට යන පාරේ කි. මී. 01ක් පමණ යන විට දෙහිගම නමැති ගමේ කෙළවරේ හමුවන පාලම අසල දකුණු පසින් ඉහත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු යඃ-

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංකය : 081-2234283
ෆැක්ස් අංකය : 081 - 2223017.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකි ය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත I. S. O 9001 : 2000
සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ/
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2224371, 081-2227593.
ෆැක්ස් අංකය : 081-2224371,

*නව නාගරික කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 011- 2585408,
දුරකථන/ෆැක්ස් අංකය :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com.

10-609

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

*පදිංචියට සුදුසු වටිනා දේපළක්* .- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවේ, රාවතාවත්ත හි පිහිටි 3 වැනි පටුමග වරිපනම් අංක 19 සහ 1/9 දරන " ගනේවත්ත" නමැති ඉඩමට බලයලත් මානක සුනිල් ජේ. පීරිස් මැන සාදන ලද අංක 5137 දරන සහ 2000.10.03 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර ලොට් "1" ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිත්දුවයි පර්චස් දාහතරයි දශම අටයි බිත්දුවක් (අ. 0, රූ. 0, පර්. 14.80) විශාල ඉඩම සහ එයට අයත් සියලුම දේ ද වේ.

*මෙම දේපළ* .- මහමෙදිගේ කමල් සිරි මෙන්ඩිස් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික

කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2000.12.06 වැනි දින අංක 4609 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මෙම දේපළට පිවිසීමට හැකි වන්නේ, මොරටුව රාවතාවත්ත හන්දියේ සිට වම් පැත්තේ ඇති ජනතා ජය මාවතේ සැතපුම් කාලක් (1/4) න් පමණ දුරක් යාමෙන් පසුවයි. මෙම මාවත දිගේ තවත් යාර 500ක් පමණ දුරක් ගිය විට මෙම දේපළ වම් පැත්තේ වරිපනම් අංක 19 ජනතා ජය මාවත නැමති ස්ථානයේ පාරට මායිම්ව පිහිටා ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013ක් වූ නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා.*- රජයේ ගැසට් පත්‍රයේ වර්ෂ 2010 ක් වූ මැයි මස 07 වැනි දින ද, අයිලන්ඩ්, තිනකරන් පුවත්පත් වල වර්ෂ 2010ක් වූ මැයි මස 13 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යː-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙක හමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් සහ සියලුම ප්‍රචාරක වියදම්ද,
5. නොතාරිස් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000ක් ද

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී ඉතිරි 90% ක මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661821, 011- 2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5657356, 011- 2334808 (ෆැක්ස්)
075-0883265.

10-593

**මහජන බැංකුව - ඕල්කට් මාවත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, දෙබැද්දේ වාද්දුව වස්කඩුව, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ වස්කඩුව උප කාර්යාල සීමාවේ, කුඩාගෝනදූව හි පිහිටි "බැල්ලපිටිය වත්ත" නමැති ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් දහනමයයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 19.50)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013ක් වූ නොවැම්බර් මස 09 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා .*- රජයේ ගැසට් පත්‍රයේ වර්ෂ 2013.07.12 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත්වල වර්ෂ 2013.09.10 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - බණ්ඩාරගම කළුතර ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් 5ක් පමණ ගිය විට ගෝනදූව, පිරවුම් හලට මදක් මෙපිටින් පාරේ දකුණු පසින් ප්‍රධාන පාරට මායිම්ව පිහිටි නිවස සහිත ඉඩම වෙ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු යː-

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තුන වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ (සියයට අනූවක්) මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය ප්‍රධාන කළමනාකරු, (කොළඹ උතුර), මහජන බැංකුව කලාපීය ප්‍රධාන කාර්යාලය, (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01, දුරකථන අංක : 011-2344985, 011- 2393946, ෆැක්ස් අංකය : 011- 4717009.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු, සාම විනිසුරු,
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-5657356, 011- 2334808 (ෆැක්ස්)
*නිවස* : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011- 2419126, 975- 0883265.

10-592

## නිවැරදි කිරීමයි

### මහජන බැංකුව - බදුල්ල මුතියංගන ශාඛාව

2013.09.27 වැනි දින පළකරන ලද අංක 1830 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස : (II ආ) ජේදය - වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් යටතේ පළ වූ අංක 09-1221 දරන නිවේදනයේ, කළුබෝවිල දුටුගැමුණු පාරේ පිහිටි වරිපනම් අංක 190/3 දරන "ඩිකහටගහලන්ද නොහොත් කහටගහවත්ත තුන්හවුල් කුරුදුවත්ත හෙදවකගහ වත්තඩ්" යන ඉඩමේ කැබලි අංක ඩී බී 1 ඒඩී දරන කොටසේ ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.75) කොටස වැරදි ලෙස පළ වී ඇත. එම කොටස පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතු ය : -

කළුබෝවිල දුටුගැමුණු පාරේ පිහිටි වරිපනම් අංක 190/3 දරන " කහටගහලන්ද නොහොත් කහටගහවත්ත තුන්හවුල් කුරුදු වත්ත හෙදවකගහවත්ත" යන ඉඩමේ කැබලි අංක "බී 1 ඒ" දරන කොටසේ ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.75).

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ සාම විනිසුරු (මුළු දිවයිනටම)

2013 ඔක්තෝබර් මස 03 වැනි දින,
*කාර්යාලය* : 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
*දුරකථන අංක* : 011- 5756356, 011 - 2334808
011- 2419126, 075- 0883265.

10-581

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 2004 ඔක්තෝබර් මස 30 වැනි දින සාදන ලද දින දරන පිඹුරු අංක 5020 හි ලොට් අංක 02 (මෙය බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් 1990 සැප්තැම්බර් මස 15 වැනි දින සාදන ලද පිඹුරු අංක 3727 හි දැක්වෙන ලොට් අංක 02 හි නැවත මිනුම්ගත කිරීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මහරගම මහ නගර සභා සීමාවන් තුළ උඩහමුල්ලේ වැටකේයාවල පාරේ පිහිටි කොරගගහ කුඹුර හෙවත් වැටකේගහ කුඹුර නම් ඉඩමේ ගොඩනැගිලි ගහකොළ වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන්කරන ලද පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර. 18.85) හෝ හෙක්ටයාර් 0.0477

ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ සහ නානායක්කාරවසම් පුල්ලේ එදරලච්චිගේ ලක්මිණි ඩයස් ගුණවර්ධන ණයකරුවන් ලෙස ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ උකස්කරු ලෙස ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2013ක් වූ නොවැම්බර් මස 08 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.07.05 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත්ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2013.10.17 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2013.10.21 දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- ශ්‍රී ජයවර්ධනපුර රෝහල් හංදියේ සිට පන්සල පාරේ ගියවිට වමට හැරුණුවිට බේකරි හංදිය හමුවේ. එම පාරේ කි. මී. 1/4ක් පමණ ගිය පසු වමට ඇති කුඹුක්ගහපොකුණ පාරේ අඩි 20ක් පළල තාර පාර හමුවේ. එම පාරේ යාර 50ක් පමණ ගිය විට වමට ඇති වැටකේයාවල පාරේ යාර 30ක් පමණ ගිය විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යඃ-

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන /ෆැක්ස් අංකය : 011- 2445393.
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 100, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
දුරකථන අංක : 011-2810942 - 3,
ෆැක්ස් අංකය : 011- 2827772.

10-602

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

පී. වී. ටී. එම්. පෙරේරා සහ එච්. බී. ඒ. ඩී. පෙරේරා.
ගිණුම් අංක : 0061 5000 4088.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012.08.30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූ හය ලක්ෂ පනස් හය දහස් හාරසිය තිහයි ශත පනස් හතරක (රු. 96,56,430.54) මුදල ද, 2012 පෙබරවාරි මස 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට හතර ලක්ෂ හැත්තෑ හය දහස් තිස් අටක (රු. 64,76,038) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් විසි හත් ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය හතලිස් හයක (27,33,346) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.01.18 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2013.01.07 වැනි දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.11.08 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බොරලැස්ගමුව ග්‍රාමයේ මහරගම පාරේ පිහිටි වරිපනම් අංක 123/12 දරන "කෝන්ගහවත්ත නොහොත් සම්බුද්ධිකෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. එන්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1999 මාර්තු 21 දාතම හා අංක 3367 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ජී. චන්ද්‍රසේන පෙරේරා සහ වෙනත් අයගේ කොලයින්කුඹුර, නැගෙනහිරට : හේවා ගමගේ දියෝනිස් යන අයගේ දේපළ, දකුණට : චන්දිනී කන්දගේ FG 3, අඩි 30 හැරෙන වටරවුම සහ අඩි 20 පළල පාර (ජී. සී. එම්. කරුණාරත්න විවාහයට පෙර පෙරේරා යන අයගේ ලොට් FG 10 සහ FG 2 සහ බස්නාහිරට : ජී. කේ. පෙරේරා සහ වෙනත් අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අක්. 0 රූ. 0 පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද, සමග එකී අංක 3367 දරන පිඹුරට අනුවය.

අංක 3367 දරන පිඹුරේ එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බොරලැස්ගමුව ග්‍රාමයේ මහරගම පාරේ පිහිටි වරිපනම් අංක 123/12 දරන "කෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එල්. නානායක්කාර යන අය විසින් සාදන ලද 1986 ජුනි මස 08 (1986.06.18 වශයෙන් ලියාපදිංචි කළ නමුත්) දාතම හා අංක 4108 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් FG 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. චන්ද්‍රසේන පෙරේරා සහ වෙනත් අයගේ කොලයින්කුඹුර, නැගෙනහිරට : වරිපනම් අංක 15/7 දරන තල්ගහවත්ත පාර, දකුණට : ලොට් FG 2, FG 3 සහ FG 10 සහ බස්නාහිරට : ජී. කේ. පෙරේරා සහ වෙනත් අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අක්. 0 රූඩ් 0 පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4108 දරන පිඹුරට අනුව වෙළුම පත්‍රිරුව M 2425/276 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

ලොට් FG10 ඉහත කී පිඹුරු අංක 4108 දක්වා ඇති අතර වෙළුම/පත්‍රිරුව M 2425/199 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-610/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

හර්ෂිණී හාඩ්වෙයාර්.
ගිණුම් අංක : 0071 1000 0280.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 මැයි මස 14 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හය ලක්ෂ තිස් හතර දහස් හැත්තෑ පහයි ශත අනූ නමයක (රු. 6,34,075.99) මුදල ද 2009 ජනවාරි මස 31 වැනි දින සිට අංක 22793 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන් ලක්ෂ හැට නම දහස් හයසිය දහසයයි ශත විසි අටක (රු. 5,69,616.28) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලියද, දැන්වීම ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.10.16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009.10.07 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2013.11.12 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ උඩුගහ පත්තුවේ බෝපගම පිහිටි "කහටගහලන්දෙවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. සී. එල්. ජී. අතුකෝරළ යන අය විසින් සාදන ලද 2005 මාර්තු 10 දාතම හා අංක 2406 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 10 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. ඩබ්ලිව්. පීටර් සිංඤෝ සහ වෙනත් අයට අයිති හොරගහලන්ද පිටඇල සහ ඩී. ඩී. අධිකාරී සහ වෙනත් අයට අයිති ගොරකගහකුඹුර, නැගෙනහිරට : පිටඇල සහ ඩී. ඩී. අධිකාරි සහ වෙනත් අයට අයිති ගොරකගහකුඹුර සහ ලොට් ජී දකුණට : ලොට් ජී සහ ප්‍රධාන පාර සහ බස්නාහිරට : ප්‍රධාන පාර සහ එච්. ඩබ්ලිව්. පීටර් සිංඤෝ සහ වෙනත් අයට අයිති හොරගහලන්ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තුනක් (අ. 0 රූ. 2 පර්. 3) හෝ හෙක්ටයාර් 0.20992ක් විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමගය.

එකී ඉඩම් කොටස පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:-

එකී බෝපගම පිහිටි කහටගහවත්ත යයි කියනු ලබන වඩා නිවැරදිව කහටගහලන්දෙවත්ත යයි කියනු ලබන ඉඩමට අංක 972 දරන අවසන් බෙදුම් පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණකොට ලොට් 10 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. ඩී. අධිකාරී සහ වෙනත් අයට අයිති ගොරකගහකුඹුර නැගෙනහිරට : ලොට් පී දකුණට : මහා මාර්ග දෙපාර්තමේන්තුවට අයත් පාර සහ බස්නාහිරට: එච්. ඩබ්ලිව්. පීටර් සිංඤෝ යන අයට අයිති හොරගහලන්ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තුනක් (අක්. 0 රූඩ්. 2 පර්. 3) විශාල ඉඩම් කොටස එකී අංක 972 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එෆ් 272/226 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමූහ සමාගම් ලේකම්.

10-610/3

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ටී. ජී. කේ. සුමිත්‍රාආරච්චි සහ එම්. එම්. එල්. පෙරේරා.
ගිණුම් අංක : 0061 500 0260.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 පෙබරවාරි මස 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැටහත් ලක්ෂ තිස් තුන් දහස් පන්සිය හැට පහයි ශතවිසි පහක (රු. 67,33,565.25) මුදල ද, 2011 අගෝස්තු මස 24 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් දෙලක්ෂ හැට හතර දහස් හාරසිය දහයයි ශත දහසයක (රු. 32,64,410.16) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් තිස් ලක්ෂ දහ හතර දහස් හතලිස් හයයි ශත හතලිස් නමයක (රු. 30,14,046.49) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.06.22 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2012.06.08 වැනි දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.11.14 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රදේශීය සභා සීවමාවන් තුළ බත්තරමුල්ල පිහිටි දම්මෝදය මාවත වරිපනම් අංක අංක 25/7, 25/7 ඒ සහ 25/7 බී (කොටසක්) දරන "*මදටියගහවත්ත නොහොත් බිලිබානතුඩු* කනත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ද එස්. ගුණතිලක යන අය විසින් සාදන ලද 2003 ජූලි 03 දාතම හා අංක 3126 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 3 නැගෙනහිරට : එම ඉඩමේ ලොට් ඒ 3 දකුණට : පාර සහ බස්නාහිරට: ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම පහක් (අක්. 0 රූඩ් 0 පර්. 14.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 3126 දරන පිඹුරට අනුව වෙලුම/පත්‍රිරුව ජී 1466/247 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

එකී අංක 3126 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3 (අඩි 2 පළල පාර සඳහා වෙන්කිරීම) බලයලත් මානක තැන එම්. බී. ද සිල්වා යන අය විසින් සාදන ලද අංක 9567 දරන පිඹුරේ නිරූපිත ලොට් ඊ (අඩි 8 පළල පාර සඳහා වෙන්කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-610/1

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අලුත්ගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ජී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2008.01.10 දිනැති සහ අංක 2241 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙණියදුර දුලිප් සමන්ත ද සිල්වා අයන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපල පිහිටි ස්ථානයේ දී 2013ක් වූ නොවැම්බර් මස 08 වැනි දින පෙ. ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.* - බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ දකුණ, අලුත්ගම බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ මාලේවන බැද්දේ උප කාර්යාල සීමාවේ මොරගොල්ල පැල්ලේවත්ත නොහොත් කිරිපැල්ලේවත්ත නමැති බලයලත් මානක ජී. එල්. ඩබ්. පෙරේරා විසින් මැන සාදන ලද 2006.03.15 වැනි දිනැති අංක 3125 දරන පිඹුර ප්‍රකාර බෙදාවෙන් කරන ලද ලොට් 1 ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස සහ ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. විශාලත්වය රූඩ් 1 පර්චස් 29.01.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.01.28 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2010.02.08 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*- බේරුවල නගරයේ සිට ගාලු පාරේ කිලෝ මීටරයක් පමණ ගොස් හෙට්ටිමුල්ල හන්දියේ ඇති ඉන්ධන පිරවුම් හල ළඟින් දකුණට ඇති "සේවියා" පාරට හැරී මීටර් 500ක් පමණ ගිය තැන හමුවන මහගොඩ හන්දියෙන් දකුණු පැත්තේ හලවාගොඩ පාරේ උතුරු කොටසට හැරී මීටර් 30ක් පමණ ගොස් එතැනින් වමට ඇති රණවිරු මාවතේ මීටර් 200ක් පමණ ගමන් කොට වමට හැරී තාර දමා ඇති මහ පාරේ මීටර් 15ක් පමණ ගිය තැන දකුණු අත පැත්තේ ඇති අදාල දේපලට පහසුවෙන් ළඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසි කරුට ගෙවිය යුතු ය :-

1. ගැනුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු)

අංක 156 1/13,
උසාවිය පාර,
කොළඹ 12.

දුරකථන අංක : 0777-378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0112 345975.

10-526

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, මදුරන්කුලිය ගමේ මානකුඹුක්කඩුවල පාරේ පිහිටි ඌණාවේළුකාහි හෙවත් පත්තයම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඕ. එම්. නජිබ් විසින් මැන සාදන ලද අංක 2511 සහ 2010 අප්‍රේල් මස 08 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01,

ප්‍රමාණය : අක්කර 02 රූඩ් 0 පර්. 0

විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු සහ සෑම සියලු අයිතිවාසිකම් ද, සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1263 සහ 2010 සැප්තැම්බර් මස 24 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් සහ දේපළ පරිශ්‍රය "සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් උකස් කොට ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ 2013ක් වූ නොවැම්බර් මස 15 වැනි දින ප. ව. 12.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයන් හි දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී., අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංක : 011- 4218746

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්.

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011- 2388318.

10-591

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.